# බළන්ගොඩ නගර සභාව - ටෙන්ඩර් දැන්වීම

## බළන්ගොඩ නගර සභාවට අයත් සභාව සතු දැන්වීම් පුවරු 10ක් බදු දීමට සුදුසු බදු කරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.

2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් සමරවීර හෙන්ද්‍රිලාගේ අමිතා කරුණාරත්න වන මා විසින් 2023 දෙසැම්බර් මස 28 වන දින පෙ.ව.10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුළ දී කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ info@balangoda.uc.gov.lk වෙතින් ලබා ගත හැකිය.

**ටෙන්ඩර්පත් නිකුත් කිරීම:**

2023 දෙසැම්බර් මස 27 වන දින ප.ව.3.00 දක්වා ටෙන්ඩර්පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේදී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් භාර ගැනීම:**

2023 දෙසැම්බර් මස 28 වන දින පෙ.ව.10.00 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ **ලේකම්, බළන්ගොඩ නගර සභාව** යන ලිපිනයට 2023 දෙසැම්බර් මස 28 වන දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ යොමු කළ හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර්පත් විවෘත කිරීම:**

2023 දෙසැම්බර් මස 28 දින පෙ.ව.10.10 ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැකිය.

**උපලේඛනය**

| අනු අංකය | ටෙන්ඩර් කැඳවනු ලබන වෙළඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල | අයදුම්පත් ගාස්තුව | අවම මාසික ටෙන්ඩර් මුදල |
|---|---|---|---|---|
| 1 | සභාව සතු දැන්වීම් පුවරු 10ක් බදු දීම | රු.25,000.00 | රු.1000.00 | රු.31,300.00 |

**විශේෂ කොන්දේසි:**

- ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදල හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- තෝරා ගන්නා ලද බදු කරුවන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකිය. එම මුදලින් තුනෙන් එකක් නොහොත් මසක කුලිය බදුකරු තෝරා ගෙන පළමු පැය තුළ ගෙවිය යුතුය. එසේ නොගෙවන බදුකරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉතිරි කොටස් දෙක නොහොත් මාස දෙකක කුළිය එකවර ගෙවා 2023.12.31 දින අවසාන වන විට ගිවිසුම් අත්සන් කළ යුතුය.
- ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුය.
- ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම්පත්‍රය සමග ලබා දෙනු ලැබේ.

2023 දෙසැම්බර් මස 13 වන දින,
බලන්ගොඩ නගර සභාවේදීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
බළන්ගොඩ නගර සභාව.